(නවවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

**අංක 2(1).]**

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2022 ජූනි 17 සිකුරාදා**

---

**2022 ජූලි 04 සඳුදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

6/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මධ්‍යම අධිවේගී මාර්ගයේ කුරුණෑගල සිට දඹුල්ල දක්වා වූ සිව්වන අදියරේ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා ටෙන්ඩර් කැඳවා තිබේද;

(ii) එසේ නම්, එම කොන්ත්‍රාත්තුව පිරිනැමීමට කටයුතු කර තිබේද;

(iii) ඉහත මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද සමාගම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගය ඉදිකිරීමේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(ii) එම මාර්ගය ඉදිකිරීම සඳහා මුදල් සපයා ගන්නා ලද මූලාශ්‍රය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නව ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම අනුමතිය ලබා දෙන ලද දිනය කවරේද;

(iii) එම නව ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය සකස් කිරීමේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(iv) එය සකස් කර අවසන් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— තාක්ෂණ හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2020 දක්වා ශ්‍රී ලංකාවේ ද්විත්ව පුරවැසිභාවය ලබා ගැනීම සඳහා ඉල්ලුම්කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ අතරින් ද්විත්ව පුරවැසිභාවය ලබා දී ඇති සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ද්විත්ව පුරවැසිභාවය සඳහා ඉල්ලුම් කරන ලද දිනයේ සිට එය ලබා දීම දක්වා වන ක්‍රියාවලිය සඳහා නිශ්චිත කාලයක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ හදවත් සැත්කම් සිදු කරනු ලබන රජයේ රෝහල් සංඛ්‍යාව;

(ii) එම එක් එක් රෝහලේ දෛනිකව සිදු කරනු ලබන හදවත් සැත්කම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හදවත් සැත්කම් සිදු කරනු ලබන වෛද්‍යවරුන්ගේ ඌනතාවයක් පවතින්නේද;

(ii) එසේ නම්, එම ඌනතාවය කොපමණද;

(iii) හදවත් සැත්කම් සිදු කරනු ලබන වෛද්‍යවරුන් හා හදවත් රෝගීන් සම්බන්ධයෙන් වෛද්‍ය-රෝගී අනුපාතය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2021.12.31 දින වනවිට හදවත් සැත්කම් සිදුකර ගැනීම සඳහා පොරොත්තු ලේඛනයේ රැඳී සිටි රෝගීන් සංඛ්‍යාව;

(ii) හදවත් රෝග හේතුවෙන් වර්ෂයකට මිය යන රෝගීන් සංඛ්‍යාව;

කොපමණද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

39/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාතික ලොතරැයි මණ්ඩලයේ ලොතරැයි ටිකට්පත් මුද්‍රණය කරනු ලබන ආයතන කවරේද;

(ii) එම ආයතන තෝරා ගනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ආයතන විසින් එක් ලොතරැයි ටිකට්පතක් මුද්‍රණය කිරීම සඳහා අය කරනු ලබන මිල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ලොතරැයි ටිකට්පත් මුද්‍රණය කිරීමේදී 2014.12.31 දිනට පෙර ඉහත ආයතනය/ ආයතනවල මිල ගණන් තුළින් විශාල මූල්‍ය අක්‍රමිකතාවක් සිදු කර තිබේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර තිබේද;

(iv) එම පරීක්ෂණයේ ප්‍රතිඵල කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

43/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, වෙන්කල්අඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 186 පන්කුඩවේලි ග්‍රාම නිලධාරි වසමේ, ඉලුප්පච්චේන ග්‍රාමයේ, මුරුගන් කෝවිල අසල පිහිටි පැරණි නටබුන් සහිත ස්ථාන විනාශකර ඇති බව පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කරදියනාරු පොලිසියට පැමිණිලි කර ඇති බව දන්නේද;

(ii) එම සිද්ධියට අදාළ පුද්ගලයන් අත්අඩංගුවට ගෙන තිබේද;

(iii) එසේ නම්, එම පුද්ගලයන්ට එරෙහිව ගෙන ඇති නීතිමය පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

44/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2020 දක්වා එක් එක් වර්ෂයේදී සමස්ත ශ්‍රී ලංකාවටම බලපාන පරිදි සිදු වූ විදුලිය බිඳවැටීම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් විදුලිය බිඳවැටීම සඳහා හේතු වූ ප්‍රධාන කරුණු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම විදුලිය බිඳවැටීම් යථා තත්ත්වයට පත් කිරීම සඳහා වැය කරන ලද මුදල ඉහත සඳහන් එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම විදුලිය බිඳවැටීම් වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

45/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රැකියා වෙළඳපොළ සහ අධ්‍යාපන ක්‍රමවේද සමපාත නොවීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ විරැකියාව ඉහළ අගයක් ගනු ලබන බවත්;

(ii) විශ්වවිද්‍යාලවල උගන්වනු ලබන ශාස්ත්‍රීය අධ්‍යාපනය සඳහා වෙන් වූ පාඨමාලා, රැකියාභිමුඛ පාඨමාලා බවට පත් කළ යුතු බවත්;

(iii) ශාස්ත්‍රීය අධ්‍යාපනය හා වෘත්තිය අධ්‍යාපනය සමාන්තරව සිදු කළ යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත කරුණු සම්බන්ධයෙන් මේ වනවිට අදාළ පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

(iii) නොඑසේ නම්, විශ්වවිද්‍යාලවල උගන්වනු ලබන ශාස්ත්‍රීය අධ්‍යාපනය සඳහා වෙන් වූ උපාධි පාඨමාලා, රැකියාභිමුඛ වෘත්තිය පාඨමාලා බවට පත්කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එය සිදු කරනු ලබන ආකාරය කවරේද;

(v) එය ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

254/2022

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ප්‍රවීණ රංගන ශිල්පී සෞම්‍ය ලියනගේ මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ, පශ්චාත් උපාධි පීඨයේ, පීඨාධිපති ලෙස පත්කරන ලද දිනය කවරේද;

(ii) ඔහු එම තනතුරෙන් ඉවත් කරන ලද දිනය කවරේද;

(iii) එම තනතුරෙන් ඒ මහතා ඉවත් කිරීමට හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

257/2022

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට 2019 දක්වා එක්සත් ජාතීන්ගේ සාමසාධක හමුදාවේ මෙහෙයුම් සඳහා යොදවා ගන්නා ලද ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදා සහ පොලිස් නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සාමසාධක හමුදාවට තෝරා ගනු ලබන නිලධාරීන් සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශයක් අවශ්‍ය බවට නියෝග කර තිබේද;

(iii) නිර්දේශ ලබා දීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව තෝරාගැනීමට හේතු කවරේද;

(iv) වර්ෂ 2010 සිට මේ දක්වා නිශ්කාෂණ වාර්තා ලබා ගැනීමට ඉහත කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද සහ නිශ්කාෂණ වාර්තා ලබා දෙන ලද ලිපිගොනු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) 2018 මාර්තු මාසයේදී ඉදිරිපත් කරන ලද ලිපිගොනු 400ක් අතරින් මේ දක්වා නිශ්කාෂණ වාර්තා ලබා දී ඇති සංඛ්‍යාව 07ක් පමණක් බව දන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ඉහත සාමසාධක හමුදාවේ මෙහෙයුම් සඳහා යොදවා ගනු ලබන ත්‍රිවිධ හමුදා සහ පොලිස් නිලධාරීන් සංඛ්‍යාව අඩු කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්,ඒ මන්ද?

258/2022

ගරු හේෂා විතානගේ මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය ආසන්නතම අධ්‍යයන වර්ෂ පහ තුළදී රජයේ විශ්වවිද්‍යාල සඳහා බඳවාගන්නා ලද සිසුන් අතරින් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ලබා දෙන ලද සිසුන් සංඛ්‍යාව;

(ii) මේ වනවිට එක් මහපොළ ශිෂ්‍යත්වලාභියෙක් වෙනුවෙන් ගෙවනු ලබන මාසික මුදල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුසලතාවය මත මහපොළ ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා සිසුන් තෝරාගනු ලබන ක්‍රමවේදය කවරේද ;

(ii) ඉහත සඳහන් අධ්‍යයන වර්ෂ පහ තුළදී ජීව විද්‍යා, ගණිත, වාණිජ සහ කලා විෂය ධාරා වෙනුවෙන් කුසලතාවය මත මහපොළ ශිෂ්‍යත්වය ලබා දෙන ලද සිසුන් සංඛ්‍යාව, එක් එක් අධ්‍යයන වර්ෂය හා එක් එක් විෂය ධාරාව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්,ඒ මන්ද?

259/2022

ගරු හේෂා විතානගේ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 වර්ෂයේදී රත්නපුර දිස්ත්‍රික්කයේ සිදු වූ පරිසර දූෂණයට අදාළව මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) පැමිණිලි වර්ගීකරණය අනුව ඒ අතරින් වැඩි වශයෙන් ලැබී ඇති පැමිණිලි වර්ගය කවරේද;

(iii) ඉහත (i) හි සඳහන් පැමිණිලි අතරින් මධ්‍යම පරිසර අධිකාරියේ පූර්ණ අනුමතිය ලබා දී ඇති ආයතන සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iv) එම ආයතන මධ්‍යම පරිසර අධිකාරියේ නීති රීති අනුව කටයුතු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රත්නපුර මහ නගර බලප්‍රදේශය තුළ ස්ථාපිත කර ඇති කර්මාන්තශාලා වලින් සිදු කරනු ලබන පරිසර දූෂණය සම්බන්ධයෙන් පරීක්ෂා කර තිබේද;

(ii) ජලයට බැර ලෝහ එකතුවීම, වායු දූෂණය සහ ශබ්ද දූෂණය සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරීක්ෂාවට ලක් කරන ලද ආයතන කවරේද;

(iii) එම පරීක්ෂා කිරීම් අනුව එළඹ ඇති නිගමන කවරේද;

(iv) ජාතික පාරිසරික පනත අනුව ලබා දී ඇති උපදෙස් නොසලකා කටයුතු කිරීම හේතුවෙන් මේ වනවිට නීතිමය පියවර ගෙන ඇති ආයතන සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

569/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ග්‍රාමීය ප්‍රාග්ධන බැංකුව ස්ථාපනය කිරීමේ අරමුණු කවරේද;

(ii) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එම බැංකුව නියාමනය කරනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

574/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඉඩම් බැංකුවක් ස්ථාපිත කිරීමට තීරණය කර තිබේද;

(ii) එසේ නම්, එය ස්ථාපිත කිරීමේ අරමුණු කවරේද;

(iii) ශ්‍රී ලංකාව සතු සීමිත භූමියෙන් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

577/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද පොහොර ප්‍රමාණය එක් එක් පොහොර වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පොහොර ආනයනය කරන ලද සමාගම් කවරේද;

(iii) ඉහත කාල සීමාව තුළදී පොහොර ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත කාල සීමාව තුළ ප්‍රමිතියෙන් තොර පොහොර ආනයනය කරන ලද බවට චෝදනා එල්ල වී ඇති සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමාගම් කවරේද;

(iii) ඉහත සමාගම්වලට එරෙහිව මේ වනතෙක් ගෙන ඇති හා ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

578/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද යූරියා පොහොර ප්‍රමාණය සහ ඒ සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) යූරියා පොහොර ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කිරීම සඳහා පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1022/2022

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) දේශීය කර්මාන්තයක් ලෙස බතික් කර්මාන්තය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මේ වනවිට බතික් කර්මාන්තයේ යෙදෙන ව්‍යවසායකයන් හඳුනාගෙන තිබේද;

(ii) එම ව්‍යවසායකයන් දිරිගැන්වීම සඳහා අමාත්‍යාංශය සතු වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) බතික් නිෂ්පාදනයේදී එම ව්‍යවසායකයන් පැරණි ක්‍රමවේද සහ විලාසිතා භාවිතා කරන බවත් එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නව තාක්ෂණය භාවිතා කරමින් නවීන විලාසිතා අනුව බතික් නිෂ්පාදනය කිරීම සඳහා මහපෙන්වීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1023/2022

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල ශිෂ්‍යභට පුහුණුවීම් සිදු කරනු ලබන බව දන්නේද;

(ii) එසේ නම්, ශිෂ්‍යභටයන් පුහුණු කිරීමේ ක්‍රියාකාරකම් සිදු කරනු ලබන පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පාසල් සංඛ්‍යාව ප්‍රමාණවත් වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශිෂ්‍යභට පුහුණුව ලබා දීමට අපේක්ෂා කරනු ලබන පාසල් තිබෙන බව පිළිගන්නේද;

(ii) එම පාසල්වල ශිෂ්‍යභටයන් පුහුණු කිරීම සඳහා පවතින බාධාවන් හඳුනාගෙන තිබේද;

(iii) ශිෂ්‍යභටයන් පුහුණු කිරීම සඳහා අවශ්‍ය පුහුණුව ගුරුවරුන්ට ලබා දී පාසල් සිසුන්ට ශිෂ්‍යභට පුහුණුව ලබාදීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1030/2022

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය වැඩි දියුණු කළ යුතු බවත්;

(ii) ඒ වෙනුවෙන් දේශීය හා විදේශීය සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා ජාතික උරුමයන් උපයෝගී කරගත යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පැරණි රාජධානි 04 පිහිටි ස්ථානවලට සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා මේ වනවිට වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(ii) දඹදෙණිය රජමහා විහාරය සහ රාජධානිය සංචාරක සිතියමට ඇතුළත් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්,ඒ මන්ද?

1181/2022

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමෘද්ධි ව්‍යාපාරය ආරම්භ කරන ලද 1995 වර්ෂය වනවිට ශ්‍රී ලංකාවේ දිළිඳුභාවය ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) සමෘද්ධි ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ක්‍රමවේදය කවරේද;

(iii) සමෘද්ධි සහනාධාරය ලැබීම සඳහා සුදුසුකම් ලබන අවම ආදායම් මට්ටම කොපමණද;

(iv) මේ වනවිට සිටින සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව ඔවුන්ට ගෙවනු ලබන එක් එක් සමෘද්ධි සහනාධාරයේ වටිනාකම අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) සමෘද්ධි සහනාධාරය ලබා දීම සඳහා වාර්ෂිකව වැය කරනු ලබන මුදල කොපමණද;

(vi) මිය යාම, ආදායම් වැඩි වීම හා වෙනත් හේතු මත වාර්ෂිකව සමෘද්ධි ව්‍යාපාරයෙන් ඉවත් කරනු ලබන සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සමෘද්ධි සහනාධාර ලැබිය යුතු නමුත් මේ වනවිට සමෘද්ධි සහනාධාරය ලැබී නොමැති අඩු ආදායම්ලාභීන් විශාල සංඛ්‍යාවක් සිටින බව පිළිගන්නේද;

(ii) ඔවුන්ට සමෘද්ධි සහනාධාරය ලබා දීම සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1183/2022

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික සහල් අවශ්‍යතාවය කොපමණද;

(ii) එම ප්‍රමාණයෙන් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන සහල් ප්‍රමාණය කොපමණද;

(iii) වාර්ෂිකව ආනයනය කරනු ලබන සහල් ප්‍රමාණය කොපමණද;

(iv) වර්ෂ 2016 සිට 2018 දක්වා කාලය තුළ සහල් ආනයනය කරනු ලැබුවේද;

(v) එසේ නම්, එම ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2014 වර්ෂයේ ශ්‍රී ලංකාවේ වී අස්වැන්න මෙට්‍රික් ටොන් කොපමණද;

(ii) එම වී අස්වැන්න සහල් බවට පරිවර්තනය කළ පසු මෙට්‍රික් ටොන් කොපමණද;

(iii) 2014 වර්ෂයේ අතිරික්ත සහල් නිෂ්පාදනය කොපමණද;

(iv) වර්ෂ 2015 සිට 2019 දක්වා ශ්‍රී ලංකාවේ වී අස්වැන්න සහ නිෂ්පාදනය කරන ලද සහල් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව මෙට්‍රික් ටොන්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම වර්ෂවලදී අතිරික්ත සහල් නිෂ්පාදනයක් පැවතියේ නම්, එම ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම වර්ෂවලදී සහල් ආනයනය කරනු ලැබුවේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1184/2022

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ වී ගොවිතැන් සිදු කරනු ලබන කුඹුරු අක්කර ප්‍රමාණය සහ වී ගොවිතැන් සිදු කරනු ලබන ගොවි පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

(ii) වර්ෂ 2015 සිට 2019 දක්වා වී ගොවිතැනෙන් ඉවත් වූ පවුල් සංඛ්‍යාව;

(iii) එම කාලය තුළ වී ගොවීන් සඳහා පොහොර සහනාධාරය ලබා දීමට වැය කරන ලද මුදල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2020 වර්ෂයේ ශ්‍රී ලංකාවේ මුළු පොහොර අවශ්‍යතාවය එක් එක් බෝගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2020 වර්ෂයේ රසායනික පොහොර ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල හා ආනයනය කරන ලද පොහොර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1189/2022

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— තාක්ෂණ හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) "නෙළුම් කුලුන" ව්‍යාපෘතිය සඳහා මුදල් සපයා ගනු ලැබූ ප්‍රභවය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා ලබා ගන්නා ලද ණය මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය මඟින් ඉපයීමට අපේක්ෂිත වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1192/2022

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2021 ජනවාරි මාසයේ සිට 2022 ජනවාරි මාසය දක්වා වන කාලය සඳහා අධිකරණ අමාත්‍යාංශයට ගොඩනැගිල්ලක් කුලියට ගැනීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබේද;

(ii) එසේ නම්, එම ගොඩනැගිල්ල පිහිටා ඇති ස්ථානයේ ලිපිනය කවරේද;

(iii) එම ගොඩනැගිල්ල කුලියට ගැනීම සඳහා වැය කරනු ලබන මුදල කොපමණද;

(iv) කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකාව මූල්‍යමය වශයෙන් අර්බුදයට පත් වී ඇති අවස්ථාවක, මෙසේ ගොඩනැගිලි කුලියට ගැනීම යෝග්‍ය වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1196/2022

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— තාක්ෂණ හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හොරණ, වගවත්ත ටයර් කර්මාන්තශාලාව ඉදිකිරීමේ ව්‍යාපෘතියට යටිතල පහසුකම් ලබා දීම සඳහා භාවිතා කරන ලද අරමුදල් කවරේද;

(ii) එම කර්මාන්තශාලාව සඳහා ලබා දී ඇති විදුලි සම්බන්ධතාවය මෙගාවොට්වලින් කොපමණද;

(iii) ඉහත ව්‍යාපෘතිය සඳහා ජල සැපයුම ලබා දෙන ලද ආකාරය කවරේද;

(iv) එම ව්‍යාපෘතියේ පිවිසුම් මාර්ගය ඉදිකිරීම සඳහා රජය විසින් වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1318/2022

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005, 2010, 2015 හා 2019 යන එක් එක් වර්ෂයේදී සිදු වී ඇති රථ වාහන අනතුරු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

(ii) එම අනතුරු හේතුවෙන් මරණයට පත් වූ පුද්ගලයන් සංඛ්‍යාව;

(iii) එම අනතුරු හේතුවෙන් හානි වී ඇති දේපළවල වටිනාකම;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1319/2022

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් නිෂ්පාදන කටයුතු සඳහා කර්මාන්තකරුවන්ට තඹ ලබා දෙන්නේද;

(ii) එසේ නම්, වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයේදී එසේ ලබා දෙන ලද තඹ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ සිදු කරන ලද පාස්කු ඉරු දින ප්‍රහාරයට සම්බන්ධ ඉන්ෂාෆ් අහමඩ් නැමැත්තාට අයත් සමාගමකට තඹ ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම සමාගමට ලබා දී ඇති තඹ ප්‍රමාණය කොපමණද;

(iii) එම තඹ ආශ්‍රයෙන් ඉහත සමාගම කරන ලද නිෂ්පාදනයන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1320/2022

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවෙන් සොයා ගෙන ඇති මැණික් වර්ග සංඛ්‍යාව;

(ii) මේ වනවිට හඳුනාගෙන ඇති, මැණික් කර්මාන්තය සඳහා යෝග්‍ය ඉඩම් ප්‍රමාණය;

(iii) මැණික් කර්මාන්තයේ නිරත වී සිටින පුද්ගලයන් සංඛ්‍යාව;

(iv) මෙම කර්මාන්තයෙන් ශ්‍රී ලංකාව වාර්ෂිකව උපයනු ලබන අපනයන ආදායම;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1467/2022

ගරු රෝහණ බංඩාර මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) අනුරාධපුර නගර සීමාව තුළ අනවසර ඉදිකිරීම් රැසක් සිදු කරනු ලබන බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම ඉදිකිරීම් නැවැත්වීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1477/2022

ගරු රෝහණ බංඩාර මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් පළාත් පාලන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම පළාත් පාලන ආයතනවල නම් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් පළාත් පාලන ආයතනයේ මේ වනවිට අනියම්, ආදේශක සහ කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම සේවකයන් ස්ථිර කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1478/2022

ගරු රෝහණ බංඩාර මහතා,— බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් පාලනය කරනු ලබන අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇති පූජනීය ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම පූජනීය ස්ථානවල නම් කවරේද;

(iii) වර්ෂ 2015 සිට මේ දක්වා එම පූජනීය ස්ථාන සංවර්ධනය කිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iv) මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් පාලනය කරනු ලබන පූජනීය ස්ථාන සංවර්ධනය කරනු ලබන ආකාරයෙන් සෙසු බෞද්ධ පූජනීය ස්ථාන ද සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1733/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා සීමාසහිත ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් ප්‍රකාශයට පත් කරන ලද පුවත්පත්/සඟරා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) ඉහත සඳහන් කාල සීමාව තුළ එක් එක් වර්ෂයේ එම ආයතනයේ ලාභ/අලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම කාල සීමාව තුළදී සීමාසහිත ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමට බඳවාගන්නා ලද සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(v) එම එක් එක් සේවකයාගේ නම, ලිපිනය හා තනතුරු නාමය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නිදහස් මාධ්‍ය කලාවක් ස්ථාපිත කිරීම සඳහා සීමාසහිත ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම භාවිතා කිරීමට අපේක්ෂා කරනු ලබන ආකාරය කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1736/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පාලනය යටතේ පවතින ගොවිපළ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) 2018 වර්ෂයේ සිට මේ දක්වා එම එක් එක් ගොවිපළේ නිෂ්පාදන සහ එම එක් එක් වර්ගයෙන් නිෂ්පාදනය කරන ලද ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත සඳහන් ගොවිපළ තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1737/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගවයින් ආශ්‍රිත රෝගී තත්ත්වයක් වර්තමානයේදී ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවලින් වාර්තා වන බව දන්නේද;

(ii) එසේ නම්, මේ වනවිට එම රෝගයට ගොදුරු වී ඇති ගවයින් සංඛ්‍යාව කොපමණද;

(iii) එම රෝගය පාලනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1948/2022

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පේරාදෙණිය, ගන්නොරුව ප්‍රදේශයේ මහවැලි ගඟ හරහා ඉදිකර ඇති සංගිලි පාලම අසල පේරාදෙණිය උද්භිද උද්‍යානයට ප්‍රතිවිරුද්ධ දිශාවට මුහුණලා මහවැලි ගඟ මායිමෙ හි අනවසර හෝටලයක් ඉදිකරමින් තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, එම අනවසර ඉදිකිරීම වැළැක්වීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මහනුවර, අනිවත්ත ප්‍රදේශයේ දොඩංවල නව පාලමට වම්පස පිහිටා ඇති (අනිවත්ත සිට හල්ඔළුව මාර්ගයට පිවිසෙන විට) මහවැලි ගඟ රක්ෂිතයේ අනවසර ඉදිකිරීම් විශාල සංඛ්‍යාවක් සිදු කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) අනවසර ඉදිකිරීම් වැළැක්වීම සඳහා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1960/2022

ගරු ගාමිණී වලේබොඩ මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ජනමාධ්‍ය විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධුර කාලය;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධුර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව;

(iii) එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්;

(iv) එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම්;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම්;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වී ඇති විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, ඒ සඳහා දරන ලද වියදම් හා එමඟින් අමාත්‍යාංශයට අත් වූ ප්‍රතිලාභ;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1995/2022

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය සමයේදී මහපොළ භාරකාර අරමුදලේ රැස්වීම්වල කාර්ය සටහන් ක්‍රමවත්ව පවත්වාගෙන ගොස් නොමැති බව දන්නේද;

(ii) ඒ හේතුවෙන් රජයේ මුදල් වංචා කිරීමට අවස්ථාව සැලසී තිබේද;

(iii) එසේ නම්, එලෙස වංචා කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මහපොළ භාරකාර අරමුදල වාර්ෂිකව විගණනය කර නොමැති බව දන්නේද;

(ii) ඒ හේතුවෙන් රජයේ මුදල් වංචා කිරීමට අවස්ථාව සැකසී තිබේද;

(iii) එසේ නම්, එලෙස වංචා කර ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මහපොළ භාරකාර අරමුදලේ අනුමතිය නොමැතිව එම අරමුදලට සම්බන්ධතාවයක් නොමැති ගිවිසුම් අත්සන් කර ඇති බව දන්නේද;

(ii) එමඟින් මහපොළ භාරකාර අරමුදලේ මුදල් වංචාකර තිබේද;

(iii) එසේ නම්, එලෙස වංචා කරන ලද මුදල කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2040/2022

ගරු මර්ජාන් ෆලීල් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ප්‍රවාහන විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධුර කාලය;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධුර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව;

(iii) එම එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්;

(iv) එම එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම්;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම්;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වූ විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, එම සංචාර සඳහා දරන ලද වියදම් හා එමඟින් අමාත්‍යාංශයට අත්වූ ප්‍රතිලාභ;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2059/2022

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධුර කාලය;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධුර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව;

(iii) එම එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්;

(iv) එම එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම්;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම්;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වූ විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, එම සංචාර සඳහා දරන ලද වියදම් හා එමගින් අමාත්‍යාංශයට අත්වූ ප්‍රතිලාභ;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2071/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා වූ කාලය තුළ ස්වාධීන රූපවාහිනී සේවයේ සහ ලක්හඬ ගුවන් විදුලියේ නව ලාංඡන ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා වූ කාලය තුළ ස්වාධීන රූපවාහිනී සේවය සහ ලක්හඬ ගුවන් විදුලිය සඳහා බඳවාගන්නා ලද උපදේශකවරුන් සංඛ්‍යාව;

(ii) එම එක් එක් උපදේශකවරයාගේ නම, අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්, ගෙවන ලද මාසික වැටුප, දීමනා හා ලබා දෙන ලද වෙනත් පහසුකම් සහ එම එක් එක් උපදේශකවරයාට ගෙවන ලද සම්පූර්ණ මුදල;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත උපදේශකවරුන් විසින් ස්වාධීන රූපවාහිනී සේවයට සහ ලක්හඬ ගුවන් විදුලියට ලබා දෙන ලද සේවය කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2114/2022

ගරු ඉෂාක් රහුමාන් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු බස් රථ සංඛ්‍යාව;

(ii) මණ්ඩලයේ මේ වනවිට සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු මගී ප්‍රවාහන බස් රථ අතරින් මේ වනවිට අධිවේගී මාර්ගවල ධාවනයට යොදවා ඇති බස් රථ සංඛ්‍යාව;

(ii) අධිවේගී මාර්ගවල ධාවනයේ යොදවා ඇති බස් රථ මඟින් ආරම්භයේ සිට මේ දක්වා ලැබූ ආදායම සහ එම බස් රථ වෙනුවෙන් සිදු කර ඇති වියදම වෙන් වෙන් වශයෙන්;

(iii) වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ආදායම සහ වියදම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2688/2022

ගරු ජේ.සී. අලවතුවල මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ග්‍රාමීය ජනතාවගේ ප්‍රවාහන පහසුකම් පුළුල් කිරීමේ අරමුණින් පසුගිය රජයේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් ග්‍රාමීය මට්ටමෙන් පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) මේ යටතේ වර්ෂ 2016 සිට 2019 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ඉදිකරන ලද එක් එක් පාලම් ව්‍යාපෘතියේ නම, එය අයත්වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල, ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කරන ලද දිනය සහ එහි වර්තමාන ප්‍රගතිය කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙම ව්‍යාපෘතිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ඉදිරියේදී පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබේ නම්, එම එක් එක් පාලම් ව්‍යාපෘතියේ නම, එය අයත්වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම, එම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල, එහි වැඩ ආරම්භ කිරීමට අපේක්ෂිත කාල වකවානුව කවරේද යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2768/2022

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2004 වර්ෂයේදී බස්නාහිර පළාතේ, ආදායම් පරීක්ෂක තනතුර සඳහා බඳවාගන්නා ලද ක්‍රමවේද;

(ii) එම එක් එක් ක්‍රමවේදය සඳහා අවශ්‍ය වූ අධ්‍යාපන සුදුසුකම් වෙන් වෙන් වශයෙන්;

(iii) 2015 වර්ෂයෙන් පසු, අංක 06/2006 දරන චක්‍රලේඛය අනුව බස්නාහිර පළාතේ, පළාත් පාලන ආයතනවල ආදායම් පරීක්ෂක තනතුර සඳහා බඳවා ගන්නා ලද ක්‍රමවේදය;

(iv) ඒ සඳහා අවශ්‍ය වූ අධ්‍යාපන සුදුසුකම්;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අංක 06/2006 චක්‍රලේඛය අනුව 2004 වර්ෂයේදී බඳවාගන්නා ලද ආදායම් පරීක්ෂකවරුන්ගේ වැටුප් අඩුවීමක් සිදු වී ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එය නිවැරදි කිරීම සඳහා ගනු ලැබූ පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2971/2022

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ, නාත්තන්ඩිය, ඉරණවිල ග්‍රාමයේ ජීවත්වන ධීවර පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානයේ ජනතාව භාවිතා කරනු ලබන ධීවර තොටුපළ මේ වනවිට දැඩි මුහුදු ඛාදනයකට ලක්වී ඇති බව දන්නේද;

(iii) ඒ හේතුවෙන් පීඩාවට පත්ව සිටින ජනතාවගේ එම ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3077/2022

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වයඹ පළාත් සභාව යටතේ ඇති සියලුම ආයතනවල මේ වනවිට කොන්ත්‍රාත් හා අනියම් පදනම මත සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයන් ස්ථිර කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3086/2022

ගරු තවරාජා කලෛයි අරසන් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, කල්මුණේ නගරය සහ ගල්ඔය ජනපදය සම්බන්ධ කරමින් කිට්ටංගිය ගඟ හරහා පිහිටා ඇති ප්‍රධාන මාර්ගය මෝසම් වැසි කාලයේදී අඩි පහකට වඩා ජලයෙන් යට වීම හේතුවෙන් එම මාර්ගය භාවිතා කරන ජනතාව විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දෙනු ලබන බවත්;

(ii) එම මාර්ගය ඔස්සේ අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්ක වෙත විශාල ලෙස ජනතාව ගමන් කරනු ලබන බවත්,

(iii) කිට්ටංගිය ගඟ හරහා පාලමක් ඉදිකර නොමැතිවීම හේතුවෙන් එම මාර්ගය භාවිතා කරන ලදුව අනතුරුවලට මුහුණදීම හේතුවෙන් පුද්ගලයන් විශාල සංඛ්‍යාවක් මියගිය අතර දේපළ ද විනාශ වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගයේ කිට්ටංගිය ගඟ හරහා මේ දක්වා පාලමක් ඉදිනොකිරීමට හේතුව;

(ii) ඉහත සඳහන් පාලම ඉදිකරනු ලබන දිනය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3156/2022

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සඳහා විමර්ශන නිලධාරීන් 200ක් බඳවාගැනීමට 2018 වර්ෂයේදී අයදුම්පත් කැඳවූ බවත්;

(ii) 2018.10.27 වන දින පවත්වන ලද බඳවාගැනීමේ විභාගයට අයදුම්කරුවන් 10,000ක් පමණ පෙනී සිටි බවත්;

(iii) විභාග ගාස්තු වශයෙන් එක් අයදුම්කරුවකුගෙන් රු.750/- ක් අය කරන ලද බවත්;

(iv) විභාගයෙන් තෝරා ගන්නා ලද අයදුම්කරුවන් 408 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයට කැඳවූ බවත්;

(v) සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා ගන්නා ලද අයදුම්කරුවන් 200 දෙනෙකුගේ ආරක්ෂණ නිෂ්කාශන වාර්තා ලබා ගෙන ඇත ද මේ දක්වා ඔවුන් බඳවාගෙන නොමැති බවත්;

(vi) ඉහත බඳවාගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර මේ වනවිට වර්ෂ 2කට අධික කාලයක් සහ එම බඳවාගැනීමට අදාළ වන කටයුතු අවසන් කර වර්ෂ 1 1/2ක පමණ කාලයක් ගත වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් විමර්ශන නිලධාරීන් කඩිනමින් බඳවාගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3157/2022

ගරු උදයන කිරිඳිගොඩ මහතා,— තාක්ෂණ හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1980 සිට මේ දක්වා විදේශීය රටක පුරවැසිභාවය ලබා ගෙන ඇති ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් ද්විත්ව පුරවැසිභාවය ලබා ගෙන ඇති ශ්‍රී ලාංකිකයන් පිළිබඳ තොරතුරු තිබේද;

(iii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iv) ශ්‍රී ලාංකිකයෙකු විදේශීය රටක පුරවැසිභාවය ලබා ගැනීමේදී ශ්‍රී ලංකාවේ රජය දැනුම්වත් කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 1989 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව නියෝජනය කරන ලද විදේශීය රටක පුරවැසිභාවය පමණක් හිමිව තිබූ මන්ත්‍රීවරයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) වර්ෂ 1989 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව නියෝජනය කරන ලද ද්විත්ව පුරවැසිභාවය හිමිව තිබූ මන්ත්‍රීවරයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ නම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3174/2022

ගරු දිලිප් වෙදආරච්චි මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත තංගල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයන් දොළොස් දෙනෙකුගෙන් සමන්විත වුවද, එම සමිතියේ බලය අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකු විසින් බලහත්කාරයෙන් අත්පත් කර ගෙන තිබෙන බවත්;

(ii) තංගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්තව සේවය කරනු ලබන සමෘද්ධි සංවර්ධන නිලධාරියෙකු මෙයට සම්බන්ධ වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ සම්බන්ධයෙන් පොලිස් විමර්ශනයක් සිදු කර තිබේද;

(ii) පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් (දකුණු පළාත) විසින් මේ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) සීමාසහිත තංගල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ සාමාජිකයන්ගේ සහ එහි ගනුදෙනුකරුවන්ගේ මුදල්වලට වගකියනු ලබන පාර්ශ්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3189/2022

ගරු සිවනේසතුරෛයි චන්ද්‍රකාන්තන් මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු මඩකලපුව දිස්ත්‍රික්කයේ තිබෙන මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඉහත ඉඩම් තිබෙන ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පවතින ආණ්ඩුව යටතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ ජීවත්වන ජනතාව අතර බෙදා දුන් කොමිෂන් සභාව සතුව තිබූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඉහත සඳහන් ඉඩම් පිහිටා තිබෙන ප්‍රදේශ කවරේද;

(iii) ඉහත සඳහන් ඉඩම් බෙදා දීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතුව තිබූ ඉඩම් බලහත්කාරයෙන් අත්පත් කරගනිමින් පවතින්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන නීතිමය පියවර කවරේද;

(iii) කොමිෂන් සභාව සතු ඉඩම් බෙදා දීමේ නව ක්‍රියාපිළිවෙළක් හඳුන්වා දී තිබේද;

(iv) එසේ නම්, එම ක්‍රියාපිළිවෙළ පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2022 ජූලි 05 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2784/2022

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයිනපුරා පිහිටි පාසල්වල වැඩ බැලීමේ පදනම මත සේවය කරනු ලබන විදුහල්පතිවරුන් සංඛ්‍යාව;

(ii) ඒ අතරින් උතුරු හා නැගෙනහිර පළාත තුළ සේවය කරනු ලබන විදුහල්පතිවරුන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වැඩ බැලීමේ පදනම මත පත්වීම් ලබා දී ඇති විදුහල්පතිවරුන්ට වැටුප් වැඩිවීම්, උසස්වීම් සහ ස්ථාන මාරු ලබා නොදීමට හේතු;

(ii) එම විදුහල්පතිවරුන්ට වැටුප් වැඩිවීම්, උසස්වීම් සහ ස්ථාන මාරු ලබා දෙනු ලබන දින වකවානු;

(iii) සාමාන්‍ය ක්‍රමවේදය යටතේ වැඩ බැලීමේ පදනමින් සේවය කරනු ලබන විදුහල්පතිවරුන් ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබුව ද, වර්තමානයේදී ඔවුන්ව ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය නොකිරීමට හේතු;

(iv) එම විදුහල්පතිවරුන් ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන දිනය;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේනම්, ඒ මන්ද?

2838/2022

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාලච්චේන කඩදාසි කර්මාන්තශාලාවේ වර්තමාන තත්ත්වය කවරේද;

(ii) එම කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඒ සඳහා ආයෝජනය කරන ලද මුදල හා දිනය;

(iv) එමඟින් උත්පාදනය වන රැකියා සංඛ්‍යාව;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත කර්මාන්තශාලාව සම්බන්ධයෙන් වංචා හා දූෂණ සිදු වන බව දන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2972/2022

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සයිප්‍රස් ජනරජයේ ස්ථාපිත කර තිබූ ශ්‍රී ලංකා කොන්සියුලර් ජනරල් කාර්යාලය වසා දමා තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා බලපාන ලද හේතු කවරේද;

(iii) එම කාර්යාලය වසා දැමීම හේතුවෙන් සයිප්‍රස් ජනරජයේ සේවය කරනු ලබන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ සුභ සාධන කටයුතුවලට දැඩි ලෙස බාධා සිදු වී ඇති බව පිළිගන්නේද;

(iv) එසේ නම්, මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3078/2022

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය යටතේ පුත්තලම දිස්ත්‍රික්කයේ ස්ථාපිත කර ඇති වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථාන ස්ථාපිත කර ඇති ස්ථානවල නම් කවරේද;

(iii) එම මධ්‍යස්ථානවල පවත්වනු ලබන වෘත්තීය පුහුණු පාඨමාලා කවරේද;

(iv) පුත්තලම දිස්ත්‍රික්කයේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3085/2022

ගරු තවරාජා කලෙයි අරසන් මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අම්පාර දිස්ත්‍රික්කයේ —

(i) නිවාස අවශ්‍යතා සහිත පවුල් සංඛ්‍යාව;

(ii) ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ආධාර මත පෞද්ගලික ඉඩම්වල අර්ධ වශයෙන් ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව;

(iii) ආදර්ශ ගම්මාන ලෙස ඉදිකර ඇති නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2018 සිට 2020 දක්වා වූ කාල වකවානුවේදී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් තිරුක්කෝවිල්, නාවිදන්වෙලි, ආලයඩිවේම්බු සහ සමන්තුරේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල යුද්ධයෙන් පීඩාවට පත්වූවන් සඳහා ක්‍රියාත්මක කරන ලද නිවාස ඉදිකිරීමේ වැඩසටහනට අදාළ හිඟ මුදල් ලබා දෙනු ලබන දිනය;

(ii) එම වැඩසටහන අවසන් කරනු ලබන දිනය;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3155/2022

ගරු අනුර දිසානායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාණ්ඩලික හෙදි වසන්තා මල්ලවආරච්චි මහත්මිය රිජ්වේ ආර්යා රෝහලේ සේවය කර 1985.04.01 දින විශ්‍රාම ගත් බවත්;

(ii) විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 2/2012 අනුව වැන්දඹු පුරුෂ / අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායකත්වය සඳහා 2012.12.18 දින ඉල්ලුම්පත් ඉහත රෝහලට භාර දුන් බවත්;

(iii) එම ඉල්ලුම්පත් ලද බව රෝහල් අධ්‍යක්ෂකගේ අංක EBB/pp/හෙදි/ඊ.ඩී. හා 2013.01.19 දිනැති ලිපියෙන් පිළිගෙන ඇති බවත්;

(iv) පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති විශ්‍රාම වැටුප් ලිපිගොනුව, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙන්වා ගත් බවත්;

(v) ඇය 2017.12.20 දින මිය ගිය පසු කලත්‍රයා වන දයාපාල හල්පෙ ගමගේ මහතා විසින් වැන්දඹු/පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප ලබා ගැනීම සඳහා අදාළ ලියවිලි විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ ද මේ වනතෙක් එය ලැබී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවෙන් සිදු වූ වරදක් හේතුවෙන් වසන්තා මහත්මියගේ වැන්දඹු /පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප නොගෙවීම වරදක් බව පිළිගන්නේද;

(ii) එම විශ්‍රාම වැටුප ගෙවීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3158/2022

ගරු උදයන කිරිඳිගොඩ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ නිලධාරින්ට, පාර්ලිමේන්තු සහ පළාත් සභා මන්ත්‍රීවරුන්ට තීරුබදු සහන යටතේ වාහන ආනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම, ආරම්භ කරන ලද වර්ෂ වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) වර්ෂ 2001 සිට මේ දක්වා රජයේ නිලධාරින්ට එම බලපත්‍ර නිකුත් කර තිබේද;

(iii) එම බලපත්‍ර සඳහා හිමිකම ඇති රජයේ සේවා සහ තනතුරු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම තනතුරු දරන නිලධාරින්ට ඉහත බලපත්‍ර ලබා දීමේදී සලකා බලනු ලබන නිර්ණායක කවරේද;

(v) එම බලපත්‍ර නිකුත් කරනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම බලපත්‍ර නිකුත් කිරීම මේ වනවිට නවතා තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) ඒ සඳහා හේතු කවරේද;

(iv) එම බලපත්‍ර නැවත නිකුත් කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) රජයේ නිලධාරීන්ට ඉහත බලපත්‍ර නිකුත් කිරීම හේතුවෙන් පසුගිය වර්ෂ 20 තුළ රජයට අහිමි වූ බදු මුදල කොපමණද;

(ii) ඉහත බලපත්‍ර නිකුත් කරන ලද රජයේ නිලධාරීන්ට රාජකාරි කටයුතු සඳහා රජයේ වාහන ලබා දී තිබේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3175/2022

ගරු දිලිප් වෙදආරච්චි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "ළඟම පාසල හොඳම පාසල" වැඩසටහන සඳහා වර්ෂ 2015 සිට 2019 දක්වා වෙන් කරන ලද මුදල;

(ii) ඉහත සඳහන් වැඩසටහන යටතේ සංවර්ධනය කරන ලද පාසල් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම වැඩසටහන යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ සංවර්ධනය කරන ලද ජාතික පාසල් සහ පළාත් පාසල් සංඛ්‍යාව;

(ii) ඒ අතරින් වැඩ නිම කර ඇති සහ වැඩ නිම කර නොමැති පාසල් සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3293/2022

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය විසින් 2015 වර්ෂයේ සිට පළාත් පාලන ආයතනයන්ට අනියම් පදනම මත කම්කරුවන් විශාල සංඛ්‍යාවක් බඳවාගන්නා ලද බව දන්නේද;

(ii) එසේ නම්, එම කම්කරුවන් අතරින් මේ දක්වා සේවය කරනු ලබන කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම කම්කරුවන් මේ වනතෙක් ස්ථිර කර නොමැති බව දන්නේද;

(iv) ඔවුන් සේවයේ ස්ථිර කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3337/2022

ගරු අලි සබ්රි රහීම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම නගරයේ කාර්මික විද්‍යාලයක් ස්ථාපිත කිරීමට මා විසින් කරන ලද ඉල්ලීම සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

(ii) එම කාර්මික විද්‍යාලය ස්ථාපිත කිරීම සඳහා ගත වන කාලය කොපමණද;

(iii) එහි පාඨමාලා දෙමළ මාධ්‍යයෙන් පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකම් සපයන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2022 ජූලි 06 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

11/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ රජයේ ව්‍යවස්ථාපිත ආයතන සඳහා අත්කර ගනු ලබන ඉඩම්වලට ගෙවිය යුතු වන්දි සහ අනෙකුත් පරිපාලන වියදම් අදාළ ආයතනය විසින් දැරිය යුතු බවත්;

(ii) එසේ වුවද, එම ආයතනවලට මහා භාණ්ඩාගාරයෙන් වෙන් කරනු ලබන ප්‍රතිපාදන ඒ සඳහා භාවිතා කරනු ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන මත ව්‍යවස්ථාපිත ආයතනවලට අත්කර ගනු ලබන පෞද්ගලික ඉඩම්, එම ආයතනවලට පැවරීමට අදාළ ක්‍රමවේදය;

(ii) ඊට අදාළ නීතිය;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන මත ව්‍යවස්ථාපිත ආයතන සඳහා අත්කර ගනු ලබන පෞද්ගලික ඉඩම්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන අනුව පැවරීමේ සහතිකයක් මඟින් එම ආයතනවලට පවරන ලෙස ඉඩම් අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය ලේකම්වරුන්ට උපදෙස් දී ඇති බවත්;

(ii) එසේ උපදෙස් ලබා දීම, ඉහත පනතේ විධිවිධානවලට, ඉඩම් නියෝගවලට සහ චක්‍රලේඛවලට පටහැනි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) එසේ නම්, මෙම තත්ත්වය නිවැරදි කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

46/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උපකාරක පන්ති පවත්වනු ලබන ආයතනවල ප්‍රමිතිය නියාමනය කිරීම සඳහා රජයේ ආයතනයක් තිබේද;

(ii) එසේ නම්, එම ආයතනයේ නම කවරේද;

(iii) එම ආයතනයේ කාර්යභාරය කවරේද;

(iv) එවැනි ආයතනයක් ස්ථාපිත කර නොමැති නම්, ඒ සඳහා ආයතනයක් ස්ථාපිත කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

252/2022

ගරු හේෂා විතානගේ මහතා,— තාක්ෂණ හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ''නෙළුම් කුලුන'' ව්‍යාපෘතිය ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතියේ වැඩ අවසන් කරන ලද දිනය කවරේද;

(iii) එම ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iv) එම ව්‍යාපෘතියේ අරමුණු කවරේද;

(v) ''නෙළුම් කුලුන'' නැරඹීම සඳහා ජනතාවට විවෘත කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ''නෙළුම් කුලුන'' ව්‍යාපෘතියේ මේ වනවිට සිදු කර ඇති ආයෝජන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයෝජන කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා එම ව්‍යාපෘතිය යොදා ගැනීමට අපේක්ෂා කරනු ලබන ආකාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

572/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේ අරමුණු කවරේද;

(ii) මේ වනවිට එම විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල ව්‍යාපාරිකයන් සහ එම ආර්ථික මධ්‍යස්ථානවලට සිය නිෂ්පාදන සපයනු ලබන ගොවීන් ඉතා අසරණ තත්ත්වයකට පත් වී ඇති බව දන්නේද;

(iii) එසේ නම්, එම ආර්ථික මධ්‍යස්ථානවලට නිෂ්පාදන සපයනු ලබන ගොවීන් සවිබල ගැන්වීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1025/2022

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සමුපකාර ග්‍රාමීය බැංකු පද්ධතිය මඟින් ග්‍රාමීය ජනතාවට විශාල සේවාවක් සිදු කරනු ලබන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ පවතින සමුපකාර ග්‍රාමීය බැංකු ශාඛා සංඛ්‍යාව කොපමණද;

(ii) සමුපකාර ග්‍රාමීය බැංකු මඟින් මේ වනවිට ක්‍රියාත්මක කරනු ලබන ණය යෝජනා ක්‍රම කවරේද;

(iii) සමුපකාර ග්‍රාමීය බැංකු පද්ධතියේ මේ වනවිට තැන්පත් කර ඇති මුළු මුදල කොපමණද;

(iv) එම තැන්පතු මුදල් ග්‍රාමීය බැංකුව විසින් ප්‍රතිතැන්පත් කර ඇත්තේ රාජ්‍ය බැංකුවල ද පෞද්ගලික බැංකුවල ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සමුපකාර පොදු අරමුදලේ ඇති මුදල කොපමණද;

(ii) එම මුදල් ආයෝජනය කරනු ලබන ආකාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1182/2022

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සේවය කරනු ලබන කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව ග්‍රාම නිලධාරී වසම්වලට අනුයුක්ත කර ඇති ආකාරය කවරේද;

(iii) එම තනතුරේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා පිරවීමට ගෙන ඇති පියවර කවරේද;

(v) උතුරු පළාත සඳහා ඉහත නිලධාරීන් පත් කර නොමැති බව දන්නේද;

(vi) උතුරු පළාත සඳහා එම නිලධාරීන් පත් කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත නිලධාරීන්ට නව සේවා ව්‍යවස්ථාවක් නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එය සකස් කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එය සකස් කරනු ලබන දිනය හා ආකාරය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඇතැම් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් ගණනයේදී, ඔවුන් ගොවි නියාමක සහ සමෘද්ධි නියාමක ලෙස කටයුතු කරන ලද සේවා කාලය සැලකිල්ලට ගෙන නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ට එම සේවා කාලය ලබා දෙනු ලබන ආකාරය හා දිනය කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1197/2022

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට සිමෙන්ති කර්මාන්තශාලාව ඉදිකිරීම සඳහා ලබා දෙන ලද ඉඩමේ විශාලත්වය කොපමණද;

(ii) ඉහත කර්මාන්තශාලාව ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා වන ආයෝජනය කොපමණද;

(iii) ඉහත ව්‍යාපෘතිය සඳහා වූ ආයෝජන ගිවිසුමට එළැඹි දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1321/2022

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "බැටික්ලෝ කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නමින් ආයතනයක් ස්ථාපිත කර තිබේද;

(ii) එම නාමය භාවිතා කරමින් විශ්වවිද්‍යාලයක් පවත්වාගෙන යනු ලබන්නේද;

(iii) එම විශ්වවිද්‍යාලය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමතිය ලැබී තිබේද;

(iv) එම විශ්වවිද්‍යාලයේ උගන්වනු ලබන පාඨමාලාවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත විශ්වවිද්‍යාලය ඉදිකිරීම සඳහා මුදල් සපයා ගන්නා ලද ආකාරය කවරේද;

(ii) විශ්වවිද්‍යාලය පවත්වාගෙන යාම සඳහා මුදල් සපයා ගනු ලබන ආකාරය කවරේද;

(iii) එම විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය හදාරනු ලබන සිසුන්ගෙන් මුදල් අය කරන්නේද;

(iv) එසේ නම්, එක් සිසුවකුගෙන් අය කරනු ලබන මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2022 ජූලි 07 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1479/2022

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගලෙන්බිඳුණුවැව ප්‍රදේශයේ ගැටලාව, දූටු වැව, තිසා වැව සහ මයිල්ගස් වැව යන ප්‍රදේශවල විශාල වශයෙන් ලූනු වගා කර ඇති බවත්;

(ii) ලූනු සඳහා නිසි මිලක් නොලැබීම හේතුවෙන් ලූනු තොග විශාල ප්‍රමාණයක් මේ වනවිට ගොවීන්ගේ නිවෙස්වල ගබඩා කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ගම්වල ගොවීන්ගේ ලූනු අලෙවිකර ගැනීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1738/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇති මහා පරිමාණ සහල් මෝල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් සහල් මෝල් හිමියාගේ නම හා ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇති සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් දැඩි මූල්‍ය දුෂ්කරතාවයකට මුහුණ පා සිටින බව දන්නේද;

(iii) එසේ නම්, සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් නගාසිටුවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1949/2022

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර ගුඩ් ෂෙඩ් බස් නැවතුම්පළ නවීකරණයට අදාළ වැඩ කටයුතු අවසන් කරනු ලබන දිනය කවරේද;

(ii) එම බස් නැවතුම්පළ නවීකරණය සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(iii) ගුඩ් ෂෙඩ් බස් නැවතුම්පළ නවීකරණයට සමගාමීව මහනුවර දුම්රිය ස්ථානයත් නවීකරණය කරන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මහනුවර ගිනි නිවන හමුදා ප්‍රධාන කාර්යාලය අසල උමං මාර්ගයක් ඉදි කිරීමට තීරණය කර තිබේද;

(ii) ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iii) එම උමං මාර්ගය ඉදිකිරීමට අදාළව පරිසර වාර්තාවක් ලබා ගෙන තිබේද;

(iv) ඒ සම්බන්ධයෙන් පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණයක් ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1961/2022

ගරු ගාමිණී වලේබොඩ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධුර කාලය;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධුර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව;

(iii) එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්;

(iv) එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම්;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම්;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වී ඇති විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, ඒ සඳහා දරන ලද වියදම් හා එමඟින් අමාත්‍යාංශයට අත් වූ ප්‍රතිලාභ;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1996/2022

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේදී ස්ථාපිත කරන ලද ලද දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය නීත්‍යානුකූල ආයතනයක් වන්නේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව එවැනි ආයතනයක් ස්ථාපිත කිරීමට බලය තිබේද;

(iv) නොඑසේ නම්, ඒ සඳහා වගකිවයුතු පුද්ගලයන් කවුරුන්ද;

(v) එම කමිටුවේ ව්‍යුහය හා සංයුතිය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2015 සිට 2017 ජූනි දක්වා ඉහත කාර්යාලය සඳහා වියදම් කර ඇති මුදල කොපමණද;

(ii) එම වියදම් දරා ඇති අංශ කවරේද;

(iii) ඉහත ආයතනය රාජ්‍ය නොවන ආයතනයක් බව දන්නේද;

(iv) එසේ නම්, එම කාර්යාලය සඳහා රජයේ මුදල් වියදම් කළ හැකිද;

(v) නොඑසේ නම්, එම මුදල් වියදම් කිරීමට අනුමතිය ලබා දීමෙන් රජයේ මුදල් අවභාවිතා කර තිබේද;

(vi) ඉහත කාර්යාලයට මුදල් වෙන් කර තිබේ නම්, එයට වගකිවයුත්තන් කවුරුන්ද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) දූෂණ මර්දන කමිටුවේ සාමාජිකයන්ට වැටුප් හෝ දීමනා ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම මුදල කොපමණද;

(iii) එම මුදල් නැවත අය කර ගන්නේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2006/2022

ගරු (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ජාතික සමාජ සංවර්ධන ආයතනයේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2014/2022

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 - 2019 දක්වා ස්වාධීන රූපවාහිනී ආයතනයේ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අධ්‍යක්‍ෂවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) ඉහත කාලය තුළ එම ආයතනයේ ක්‍රියාකාරී අධ්‍යක්‍ෂවරයාගේ නම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ක්‍රියාකාරී අධ්‍යක්‍ෂවරයාට සම්බන්ධ පෞද්ගලික ආයතනයක් විසින් නිෂ්පාදනය කරන ලද ''ඕවර් ෂෝල්ඩර්ස්'', ''මහාචාර්ය යෞවනය'', ''සංචාරේ'' යන වැඩසටහන් විකාශය කිරීම සඳහා වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ස්වාධීන රූපවාහිනිය විසින් නිෂ්පාදනය කරන ලද ''සවනක් රැස්'' වැඩසටහන විකාශය කිරීම වෙනුවට එවකට එම ආයතනයේ සභාපතිවරයාගේ සහෝදරයෙකුට සම්බන්ධ ආයතනයක් විසින් නිෂ්පාදනය කරන ලද ''දඹදිව'' වැඩසටහන විකාශය කිරීම ගෙවන ලද මුදල කොපමණද;

(iii) එම අයථා ගනුදෙනු සඳහා වැය කර ඇති සම්පූර්ණ මුදල කොපමණද;

(iv) ඒ සඳහා වගකිව යුතු නිලධාරීන්ගේ නම් කවරේද;

(v) එම මුදල්, වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගන්නේද;

(vi) නොඑසේ නම්, ඔවුන්ට විරුද්ධව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2025/2022

ගරු මධුර විතානගේ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධි ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2042/2022

ගරු මර්ජාන් ෆලීල් මහතා,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා සමාජ සවිබලගැන්වීම්, සුභසාධන විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධුර කාලය;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධුර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව;

(iii) එම එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්;

(iv) එම එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම්;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම්;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වූ විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, එම සංචාර සඳහා දරන ලද වියදම් හා එමඟින් අමාත්‍යාංශයට අත්වූ ප්‍රතිලාභ;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2045/2022

ගරු කුමාරසිරි රත්නායක මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති සුළු වාරිමාර්ග යටතට අයත්වන වැව් හා අමුණු සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැව් හා අමුණු පිහිටා ඇති ප්‍රදේශවල නම් කවරේද;

(iii) ඉහත සඳහන් වැව් හා අමුණු අතරින් වර්ෂ 2015 සිට 2019 දක්වා ප්‍රතිසංස්කරණය කරන ලද වැව් හා අමුණු සංඛ්‍යාව කොපමණද;

(iv) එම වැව් හා අමුණුවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i) හි සඳහන් වැව් හා අමුණු අතරින් අලුත්වැඩියා කළ යුතු බවට මේ වනවිට හඳුනාගෙන ඇති වැව් හා අමුණු සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් 2020 වර්ෂයේදී අලුත්වැඩියා කරන ලද වැව් හා අමුණු සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ නම් කවරේද;

(iv) 2021 වර්ෂයේදී අලුත්වැඩියා කිරීමට යෝජිත වැව් හා අමුණු සංඛ්‍යාව කොපමණද;

(v) ඒවායේ නම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2022 ජූලි 08 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2061/2022

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා,—අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා උසස් අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධුර කාලය;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධුර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව;

(iii) එම එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්;

(iv) එම එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම්;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම්;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වූ විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, එම සංචාර සඳහා දරන ලද වියදම් හා එමඟින් අමාත්‍යාංශයට අත්වූ ප්‍රතිලාභ;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2073/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2097/2022

ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පී/17 ග්‍රාම නිලධාරි වසමේ කෘෂිකාර්මික කටයුතුවල නිරතවන ජනතාවගේ වගාවන් වන අලි විසින් නිරන්තරයෙන් විනාශ කරනු ලබන බවත්;

(ii) වන අලි තර්ජනය හේතුවෙන් ඉහත ප්‍රදේශවල ජීවත්වන පාසල් ළමුන් පාසල් යාමට අකමැත්තක් දක්වන බවත්;

(iii) ප්‍රදේශයේ අලි වැටවල් වන අලින් විසින් විනාශ කර ඇති බවත්;

(iv) අලි වැට සකස් කර දෙන ලෙස අදාළ නිලධාරින්ගෙන් ඉල්ලීම් කළද එය මේ වනතෙක් ඉටු කර නොමැති බවත්;

(v) මේ හේතුවෙන් එම ජනතාවට ප්‍රදේශය අත්හැර වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වීමට සිදුවන තත්ත්වයක් උදාවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2115/2022

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇති රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම පාසල්වල උගන්වනු ලබන එක් එක් විෂයට අදාළව —

(i) අනුමත ගුරුවරුන් සංඛ්‍යාව;

(ii) මේ වනවිට සේවය කරනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව;

(iii) මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත (ආ) (iii) හි සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2262/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ වතුකරයේ ජීවත් වන පවුල් සඳහා නිවාස පහසුකම් ලබා දීමට —

(i) මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග;

(ii) ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2458/2022

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිලෝමීටර් ලක්ෂයක් කාපට් අතුරා සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ මේ වනවිට සංවර්ධනය කර ඇති මාර්ගවල දුර ප්‍රමාණය කොපමණද;

(ii) මාර්ග සංවර්ධනය කිරීමේදී බොහෝ මාර්ගවල පැති කාණු සංවර්ධනය නොකිරීම විශාල ගැටලුවක් බවට පත්ව ඇති බව දන්නේද;

(iii) මාර්ග සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී ඒ සම්බන්ධව අවධානය යොමු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2468/2022

ගරු රෝහණ දිසානායක මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම සතු තේ කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) එම කර්මාන්තශාලා පිහිටා ඇති ස්ථාන කවරේද;

(iii) ඒ අතරින් ක්‍රියාත්මක තත්ත්වයේ පවතින සහ ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින එක් එක් කර්මාන්තශාලාවේ නම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින කර්මාන්තශාලා එසේ පැවතීමට හේතු කවරේද;

(v) මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින තේ කර්මාන්තශාලා උපයෝගී කර ගනිමින් තේ නිෂ්පාදනය කිරීමට ඉල්ලුම් කරන ලද ඉල්ලුම්කරුවන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම විසින් සිය තේ කර්මාන්ත ශාලා පුද්ගලික අංශයට පවරා දී තිබේද;

(ii) එසේ නම්, එම කර්මාන්තශාලාවල නම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2573/2022

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ පාසල් සිසුන්ගේ මන්දපෝෂණ අනුපාතය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පාසල් සිසුන්ගේ මන්දපෝෂණය තුරන් කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2580/2022

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් මේ වනවිට අත්‍යවශ්‍ය භාණ්ඩ ලෙස නම් කර ඇති භාණ්ඩ වර්ගවල නම් කවරේද;

(ii) මේ වනවිට බොහෝ භාණ්ඩවල මිල කිසිදු පාලනයකින් තොරව ව්‍යාපාරිකයන් විසින් අත්තනෝමතික ලෙස ඉහළ නංවා ඇති බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) භාණ්ඩවල වෙළඳපොළ මිල පාලනය කිරීම සම්බන්ධයෙන් අධිකාරිය විසින් මේ වනවිට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මඟින් අදාළ පනත නිසි පරිදි ක්‍රියාත්මක නොකරන බව පිළිගන්නේද;

(iii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iv) වෙළඳපොළේ භාණ්ඩ මිල තීරණය කරනු ලබන්නේ වෙළඳපොළ බලවේග මත බව පිළිගන්නේද;

(v) එසේ නම්, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යභාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2635/2022

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට ඩොලර් ලැබෙන ක්‍රම කවරේද;

(ii) මේ වනවිට ශ්‍රී ලංකාව ඩොලර් සම්බන්ධ ගැටලුවකට මුහුණ දී සිටින බව දන්නේද;

(iii) එම ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?